

# දේශය වෙනුවෙන් දිවි පිදූ ප්‍රථම හමුදා වීරවරිය - ඉරේෂා

ඉරේෂා නිල්මිණී යුදහමුදා පොලිස් හා යුද හමුදා නිත්‍ය බලකායේ ප්‍රථමයෙන් දිවිපිදූ නිත්‍ය වීරවරිය ලෙස යුදහමුදා ඉතිහාසයට එක්වන්නීය.

මෙම වීර තරුණියගේ 10 වෙනි ගුණ සමරුව පසු ගිය ජනවාරි මස 2 වෙනි දින ශ්‍රී ජයවර්ධන පුර, ඇතුල් කෝට්ටේ ඇයගේ නිවසේ දී යුද හමුදා නිලධාරීන් හා නිලධාරිනියන් පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණ.

1974 මැයි මස 2 වෙනි දින උපත ලද ඉරේෂා නිල්මිණී, නුගේගොඩ ශාන්ත ජෝශප් බාලිකා විදුහලෙන් අධ්‍යාපනය ලබා 1992 අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් වාණිජ අංශයෙන් උසස් ලෙස සමත්වූවා ය.

මස 27 වෙනි දින පළමුවන ශ්‍රීලංකා යුද හමුදා කාන්තා බලකායේ 15 වෙනි පුහුණුවීම් බලකායේ ආධුනික සෙබළ අංක 58860 නිල අංකය යටතේ හමුදා පුහුණුව ලැබුවා ය. ලාන්ස් කෝප්‍රල් තනතුරක් සඳහා 1995 මාර්තු 8 වෙනි දින උසස් කරනු ලැබූ ඉරේෂා යුද හමුදා පොලීසියේ 39 වැනි විනයාරක්‍ෂක රෙජමේන්තුවට ඇතුළත්ව 1995 මාර්තු මස සිට ජුනි මස 2 වැනි දින දක්වා යුද හමුදා පොලිස් පුහුණුවත් ලැබුවා ය.

ලක් වනිතාව කවදත් එඩිතර ය. ගෑහැනිය ගෙයි මුල්ලට කර තිබූ යුගය නිමාකරමින් ඇය පිරිමින් හා කරටකර සිටින තත්වයට ආවේ අද ඊයේ නොවේ. එදා ගේ දොර බලා කියාගනිමින්, දරුමල්ලන් හදා වඩා ගනිමින් කල් ගෙවූ වනිතාව පසු කාලයේ දී මුළු මහත් ජන සමාජයම යහ මගට ගනිමින් රට කරවන තත්ව යටද පත්වූවා ය. අනුලා බිසව, සෝමා දේවී සහ විහාර මහාදේවිය යුගයෙන් යුගයට රට දැය වෙනුවෙන් පෙරට ආ එවන් කතුන් අතර විශේෂ ය.

වත්මනෙහි රටෙහි පවතින කුරිරු යුද්ධය නිසා රට දැය වෙනුවෙන් දිවිපිදූ වීරයන් අතරට වීරවරියන් ද එක්ව සිටීම මුළුමහත් වනිතා පරපුර-ටම ආඩම්බරයකි. අප මේ කතා කරනුයේ එවන් වීරවරියක් පිළිබඳවය. රට වෙනුවෙන් දිවි දුන් ප්‍රථම වීරවරිය ලෙස ඇය ඉතිහාස ගතවන්නී ය.

ඇය ඉරේෂා නිල්මිණී ද සිල්වා මෙනවියයි. යාපනය ප්‍රදේශයේදී 1997 ජනවාරි 2 වෙනි දින ඇය සිය උපන් දේශය වෙනුවෙන් දිවි පිදුවා ය. එල්ටීටීඊයේ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් මියයද්දී ඇය යුද හමුදා පොලිස් කණ්ඩායමේ කෝප්‍රල්වරියක වූවා ය. එම පිපිරීමෙන් ඇගේ සිරුර හඳුනාගත නොහැකි තරමට සුණු විසුණු වී තිබුණි. පූර්ණ භූමි හා දේශ පුත්‍රී සම්මානයෙන් පුද ලද කෝප්‍රල්



*මේජර් රමණි කාන්ගරආරච්චි මහත්මිය ඉරේෂා නිල්මිණීගේ පිළිරුව ඉදිරියේ ඉටිපහනක් දල්වමින් සමරු දිනයේ ඇය සිහිපත් කරයි.*

සිංගප්පූරු ගුවන්සේවය සහ ලේක්හවුස් ආයතනයේ ඔබ්සර්වර් පුවත්පතේ අනුග්‍රහයෙන් පැවති **මිස් ශ්‍රීලංකා** රූප සුන්දරී තරඟයටද ඉදිරිපත් වූ ඉරේෂා අවසන් නිරූපිකාවන් 15 දෙනා අතරටද ඇතුළත් වූවා ය.

නාරාහේන්පිට ආසිරි රෝහලේ අමුත්තන් පිළිගන්නිය වශයෙන් 1994 දී සේවය කරමින් සිටියදී ප්‍රතිකාර ගැනීමට එම රෝහලට එන යුද හමුදා පොලිස් කාන්තාවන් සමග මිත්‍ර වූ ඉරේෂා පසුව හමුදා සේවයට එක්වූවා ය. යුද හමුදා පොලිස් කාන්තා සේවාවට 1994 ඔක් 28 දා ඇතුළත් වූ ඇය, එම වසරේම දෙසැම්බර්

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ප්‍රධානත්වයෙන් 1995 අප්‍රියෙල් 14 වෙනිදා යුද හමුදා ක්‍රීඩා පිටියේ පැවති යුද හමුදා අවුරුදු කුමාරි තරඟයෙන්ද ඉරේෂා තුන්වන ස්ථානය ලැබුවාය. 38 වන යුද හමුදා පොලිස් බලකායට ඇතුළත්ව පලාලි, අනුරාධපුර කන්කසන්තුරය යන පළාත්වල 1995 අගෝස්තු 8 වෙනිදා දක්වා සේවය කර 1996 දෙසැම්බර් 24 වෙනිදා දක්වා යුද හමුදා පොලිස් මූලස්ථාන යට අනුයුක්තව සේවය කළාය.

එවකට යුද හමුදාපතිව සිටි රොහාන් දළුවත්ත මහතාගේ කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරිනිය ලෙස ද සේවය කරමින් සිටියදී 1996. 12. 25 සිට 1997. 12. 26 දක්වා යාපනයේ මෙහෙයුම් රාජකාරි යෑමට ඉරේෂාට නියෝගයක් ලැබිණ. ඇය මිය යාමට පෙර දින, එනම්, 1997 ජනවාරි 1 වැනි දින පලාලිහි දී ඉරේෂා ඇගේ දිනපොතේ **මට සුබ නව වසරක්** යනුවෙන් සටහන් කර තිබූ අයුරු අපට දක්නට ලැබිණ.

***සටහන හා ඡායාරූප***

***♦ නන්ද ඒකනායක***

# The Power of a Brick

**A** young and successful executive was traveling down a neighborhood street, going a bit too fast in his new Jaguar. He was watching for kids darting out from between parked cars and slowed down when he thought he saw something. As his car passed, no children appeared. Instead, a brick smashed into the Jag's side door! He slammed on the brakes and backed the Jag back to the spot where the brick had been thrown.

The angry driver then jumped out of the car, grabbed the nearest kid and pushed him up against a parked car shouting, " What was that all about and who are you? Just what the heck are you doing? That's a new car and that brick you threw is going to cost a lot of money. Why did you do it ? "

The young boy was apologetic. " Please, Sir...please, I'm sorry but I didn't know what else to do." He pleaded. " I threw the brick because no one else would stop..." With tears dripping down his face and off his chin, the youth pointed to a spot just around a parked car. " It's my brother " he said. " He rolled off the curb and fell out of his wheelchair and I can't lift him up."

Now sobbing, the boy asked the stunned executive, " Would you please help me get him back into his wheelchair? He's hurt and he's too heavy for me."

Moved beyond words, the driver hurriedly lifted the handicapped boy back into the wheelchair, then took out a handkerchief, dabbed at the fresh scrapes and cuts.

" Thank you and may God bless you " the grateful child told the stranger.

Too shook up for words, the man simply watched the boy push his wheelchair-bound brother down the sidewalk toward their home.

It was a long, slow walk back to the Jaguar. The damage was very noticeable, but the driver never bothered to repair the dented side door. He kept the dent there to remind him of this message:

**Don't go through life so fast that someone has to throw a brick at you to get your attention !**

# ගඩොලක බලය



තරුණ විධායක නිලධාරියෙක් දිනක් තම අළුත්ම මෝටර් රථයෙන් කාර්යාලයට යමින් සිටියදී හදිසියේම කවුදෝ පාර අයිනේ සිට දමාගැසූ කිසිවකින් කාර් එකේ වීදුරුවක් බිඳීගියේය. නිලධාරියා වහා බ්‍රේක්ගසා රිය නවතා එය යළිත් පසුපසට ගෙන ගියේය. රථයෙන් බැස්ස ඔහු දුටුවේ පැත්තක දොර ද තැලී ඇති බවයි. එය කිසිවෙකු දමා ගැසූ ගඩොල් කැටයකි. ඔහු පාර අයිනේ සිටි පොඩි කොලුවෙකු අල්ලාගත්තේය. " බලපං යකෝ අළුත්ම කාර් එකට උඹ කළ දේ " ඔහු කෝපයෙන් කොලුවා සෙලවී ය.

" අනේ සර් මට සමාවෙන්න" කොලුවා අඩමින් කීවේය. " මගේ මල්ලි අබ්බගාතයෙක්. රෝද පුටුවෙ ඉන්නෙ. පුටුව පෙරලුනා කානුවට. මට එයාව නැගිට්ටව ගන්න බෑ. මට උදව්වක් ගන්න කෙනෙක් නෑ. මෙතනින් යන කිසි කෙනෙක් වාහනේ නවත්තන්නෙ නෑ. ඒකයි මම එහෙම කළේ. අනේ සර් මට මල්ලිව කානුවෙන් උඩට ගන්න ඕන. අනේ මට පිහිට වෙන්න."

නිලධාරියා ගල්ගැසී මේ කතාව අසා සිටියේය. ඔහුගේ ඇසට කඳුලක්ද නැගිණ. " කෝ මල්ලි ? " ඔහු කොලුවා සමග ගොස් කානුවට වැටී සිටි අබ්බගාත ළමයා ඉහළට ගෙන රෝද පුටුවේ තැබීය. කොලුවා ස්තුති කර පුටුව ද තල්ලුකරගෙන ගියේ ය.

නිලධාරියා තැලුණු දොර හැදුවේ නැත. එය ඔහුට කිසියම් අවවාදයක් මතක් කළේය. එනම්, " **ඔබ ජීවිතයේ යන වේගය වැඩි වුනාම ඔබේ අවධානය ගන්නට ඔබට ගඩොල් කැටයකින් ගසන්නට කෙනෙකුට සිද්ධවේවි. ඒ නිසා හෙමින් පරිස්සමින් යන්න !**"

***♦ Deepa Sandamali Herath* - USA**




# බර බාගේ....... බර බාගේ....... දුටු ඒ.... සිහිනේ....පෙර කාලේ.......



**ඇ**ත්තම කියන්නම් මගේ ප්‍රියතම ගායකයා සී. ටී. ප්‍රනාන්දු. සී. ටී. ගෙ සෑම ගීතයකටම මම ආසයි. **මා බාල කාලේ**, **බිළිඳා නැළවේ උකුලේ**, **පින්සිදුවන්නේ** සහ **බරබාගේ** ඒ අතරේ විශේෂයි. සී. ටී.ගෙ සිංදු එවර් ග්‍රීන්. එහෙමත් නැත්නම් සදාහරිත යි. කවදාවත් ඒවායේ අගය අඩුවෙන්නෙ නෑ. සිංහළයින් ලෝකෙ කොයි දීපංකරේ හිටියත්, විනෝද ගමනක් ගියත්, පාටියක් තිබුණත්, එච්චර විතරක් නෙවෙයි, නානකාමරේ නාන ගමනුත්, රැවුල කපන ගමනුත් කියන්නෙ සී. ටී. ගෙ සිංදුවක කෑල්ලක්. සී. ටී. ඇත්තටම අමරණීයයි.

සී. ටී ගැන මට මේ ඊයෙ පෙරේදා මතක් වුණේ ශ්‍රීලංකාවෙ විපක්‍ෂය කොළඹ සංවිධානය කරපු බරකරත්ත පෙළපාලිය ගැන අහලා. මට එතකොටම ඔළුවට ආවේ සී. ටී ගෙ බරබාගේ සිංදුව. හැබැයි විපක්‍ෂය ඒ කරත්ත පෙරහැර ගෙනිච්චෙ රජයට විරුද්ධත්වයක් පෙන්නුම් කරන්න. මොකද දැන් තෙල් මිළ නැගලා වාහනයක් දුවවන්න විදියක් නැහැ. තෙල් නිසා බඩු ගණන් ගිහිල්ලා. කන්න නැතුව බඩගිනි වුනාම කැත්ත, උදැල්ල හේන, කුඹුර මතක්වෙනව වගේ තෙල් මිළ ඉහළ ගියාම පැත්තකට දාලා තිබුණු ගොං කරත්තෙ ඔන්න මතක් වුණා. මොන අපහසයක් කළාද අපේ මුත්තලගෙ කාලෙට? බරකරත්ත යුගය කියලා. රට ඉදිරියට යන්න කරත්තෙන් බෑ කිව්වා.

සමහරු බනිනවා විපක්‍ෂය මේක කරන්නෙ ප්‍රසිද්ධියක් ගන්න ප්‍රෝඩාවට කියලා. මම නම් එහෙම හිතන්නෙ නැහැ. දැන් කාලෙ අපි කවුරුත් දන්නවා වාහනවල ඉන්ධන දහන යෙන් පිටවන දුම වායුගෝලයට කොතරම් අහිතකරද කියන එක. ගිනි ගහන්න පායන්නෙ, රස්නෙ, ඒ එක්කම ජලගැල්ම, ඔය ආදී දේ ඇතිවුණේ පරිසර හා වායුගෝල දූෂණය නිසා. ඉස්සර අපේ මුත්තලා ගොං කරත්ත පාරට දාපු කාලෙ වායුගෝලෙට කිසිම අප්සට් එකක් වුණේ නැහැ. මේ සේරම පරිසර දූෂණ ඇක්සිඩන්ට්, අතුරු ආන්තරා සේරම වාහන හින්දයි. ඉතින් විපක්‍ෂය බරකරත්තෙ ආයිත් ඉස්සරහට ගත්තෙ කාටත් ආදර්ශයක් දෙන්න. හැබැයි ඉතින් කරත්තෙට කාර් එක වගේ වේගෙන් යන්න බෑ. කමක් නෑ. හදිස්සියක් නෑනේ.

සී. ටී ගෙ බරබාගෙ සිංදුවෙ එක තැනක මෙහෙම තියනවා. " රාළද ගෝනි පඩංගුවෙ ඉන්නේ... සතුටිනි ගැල පදවන්නේ...." කියලා. මේ මෙදා කොළඹ පාරට දාපු බරකරත්තවල විශේෂයක් තිබුණා. ඉස්සර කාලෙ අමුඩෙ ගහගෙන, දාඩිය පෙරාගෙන, හඩු ගඳ ගගහ කරත්ත දක්කපු රාළලා වෙනුවට මේ කරත්තවල නැගල එදා දැක්කුවෙ කොළඹ කුරුඳු වත්තෙ තරුණ නෝනලා. ලිප්ස්ටික්, කියුටෙක්ස් ගාලා, පැරිස් ෂැනල් සුවඳ විලවුන් නාලා, ඉතා ලලිත විදියට කරත්තෙට නැග්ගම ගොන්නුන්ට වුනත් ටක් ගාලා වෙනස තේරෙන්න ඇති කියලා මට හිතෙනවා. බරක් ගැන හිතන්නෙවත් නැතුව උන් ඉතාම ආසාවෙන් කරත්ත ඇදගෙන යන්න ඇති. ඊටත් වැඩිය ඒ නෝනලා කෑගගහ ගිය සටන් පාඨ. " අපේ ගොනා අපට හොඳයි! " අනේ ගොනාට මොන තරම් ආඩම්බරයක් හිතෙන්න ඇද්ද?

මේ සේරම යහපත් අදහසකින් කළ බව ඇත්ත. බර කරත්තයටත් අළුත් ජීවයක් සහ පිළිගැනීමක්. හැබැයි ඉතින් එක දවසක් කරත්තෙ දක්කලා පරිසර දූෂණය නවත්තන්න බෑ. ප්‍රථිපලයක් ගන්න නම් බර කරත්ත හැමදාම පාරට දාන්න ඕන. ඒ පාර අර තියන වාහන කන්දරාවට මොකද කරන්නෙ? ඒකත් ප්‍රශ්නයක්. පරණ යකඩ වලට පංචිකාවත්තට විකුණුවත් ඒවා අරන් ඒ මිනිස්සු මොනව කරන්නද? කතාවක් තියනවා අර කරත්තවල ගිය නෝනලා ටික වෙලාවකින් කරත්තෙන් බැහැලා පැජරෝවල නැගලා ගියයි කියලා. කරත්තෙ ඇදපු ගොන්නු ඒක තවම දන්නෙ නෑ. මොකද උන් කොහොමත් ගෙන්නු නිසා.

**♦ වෙලේගෙදර රාළ London**